**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 02 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.1.XVI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ රඹුක්කන සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව රඹුක්කන ප්‍රාදේශීය සභාව මඟින් දියුණු කල ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල ගොඩනැගිලිවල ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2020 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය මත 2025 වර්ෂයේ වටිනාකම 2026 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත යථෝක්ත පනතේ 134(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 01 වැනි උප ලේඛනයෙහි පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) සහ 02 වැනි උප ලේඛනයෙහි පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) ක වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද 2026 වර්ෂයෙහි 03 වැනි උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

**උප ලේඛනය 01**

| කොට්ඨාශය | වරිපනම් අංකය | බදු ප්‍රතිශතය |
|---|---|---|
| **කොට්ඨාශ අංක 01** | | |
| කුරුණෑගල පාර වම | 101/24-189 | 6% |
| හුරීමළුව පාර වම | 3-109 | 6% |
| හුරීමළුව පාර දකුණ | 4-102/52 | 6% |
| මැදගොඩැල්ල පාර දකුණ | 1-10 | 6% |
| මැදගොඩැල්ල පාර වම | 1 | 6% |
| මොහිදීන් මාවත වම | 1-23/A | 6% |
| මොහිදීන් මාවත දකුණ | 4-56 A | 6% |

| | | |
|---|---|---|
| | | |
| **කොට්ඨාශ අංක 02** | | |
| බෝධිරාජ මාවත වම | 7-39 | 6% |
| බෝධිරාජ මාවත දකුණ | 6-48 | 6% |
| ධර්මපාල මාවත වම | 1-35 | 6% |
| ධර්මපාල මාවත දකුණ | 2-36 | 6% |
| තෝමස් සිල්වා මාවත වම | 3-3/2/1 | 6% |
| තෝමස් සිල්වා මාවත දකුණ | 2-14 | 6% |
| කරඩුපන පාර දකුණ | 30/30-110 | 6% |
| කුරුණෑගල පාර වම | 1-101/ A | 6% |
| කුරුණෑගල පාර දකුණ | 80-248 | 6% |
| සේනානායක මාවත වම | 1-53/40 | 6% |
| සේනානායක මාවත දකුණ | 2-50/2 | 6% |
| දුම්රියපල පාර වම | 25-25/24 | 6% |
| දුම්රියපල පාර දකුණ | 8-58/ A | 6% |
| | | |
| **කොට්ඨාශ අංක 03** | | |
| රෝහල පාර වම | 1-35/ A | 6% |
| කුරුණෑගල පාර දකුණ | 2-78/ A | 6% |
| කරඩුපන පාර දකුණ | 2-32 | 6% |
| මාවනැල්ල පාර වම | 1-81 | 6% |

| | | |
|---|---|---|
| **කොට්ඨාශ අංක 04** | | |
| මිහිඳු මාවත වම | 5-69 | 6% |
| මිහිඳු මාවත දකුණ | 2-74 | 6% |
| රෝහල පාර වම | 33-103 | 6% |
| රෝහල පාර දකුණ | 72-92 | 6% |
| ගැමුණු මාවත වම | 1-35 | 6% |
| ගැමුණු මාවත දකුණ | 4-60 | 6% |
| කුරුණෑගල පාර දකුණ | 244-266 | 6% |
| | | |
| **කොට්ඨාශ අංක 05** | | |
| රෝහල පාර | 6-76 | 6% |
| මාවනැල්ල පාර | 85-179/40 | 6% |
| රාජසිංහ මාවත වම | 7-35 | 6% |
| | | |

| | | |
|---|---|---|
| **කොට්ඨාශ අංක 06** | | |
| අශෝක මාවත වම | 1-23 | 6% |
| බණ්ඩාරනායක මාවත වම | 7-29 | 6% |
| මාවනැල්ල පාර වම | 185-257 | 6% |
| මාවනැල්ල පාර දකුණ | 100-152 | 6% |
| කොතලාවල පාර වම | 7-55 | 6% |
| කොතලාවල පාර දකුණ | 8-54 | 6% |
| රාජසිංහ මාවත දකුණ | 8-62 | 6% |
| දහනායක මාවත වම | 3-23 | 6% |
| දහනායක මාවත දකුණ | 4-32 | 6% |
| | | |
| **කොට්ඨාශ අංක 07** | | |
| කරඩුපන පාර වම | 3-153/ A | 6% |
| කීර්තිරත්න මාවත වම | 5-31/4 | 6% |
| කීර්තිරත්න මාවත දකුණ | 6-78 | 6% |
| කන්දහේන පාර වම | 3-21/10 | 6% |
| කන්දහේන පාර දකුණ | 6-36 | 6% |
| කළුගල්ල මාවත වම | 3-35 | 6% |
| කළුගල්ල මාවත දකුණ | 2-22 | 6% |

| | | |
|---|---|---|
| මාවනැල්ල පාර දකුණ | 74/1-96/11 | 6% |
| මහඔය පාර වම | 3-69 | 6% |
| මහඔය පාර දකුණ | 2-60 | 6% |
| මිලී මාවත වම | 3-39 | 6% |
| මිලී මාවත දකුණ | 8-24 | 6% |

**උප ලේඛනය 02**

| කොට්ඨාශය | වරිපනම් අංකය | බදු ප්‍රතිශතය |
|---|---|---|
| **කොට්ඨාශ අංක 08 ( පින්නවල දියුණු කල ප්‍රදේශය )** | | |
| රඹුක්කන පාර වම | 409-871/1 | 5% |
| රඹුක්කන පාර දකුණ | 362-872/2 | 5% |
| නුවර පාර වම | 41-665/ A/1 | 5% |
| නුවර පාර දකුණ | 1030/1 | 5% |
| පොල්ගහවෙල පාර වම | 3-25 | 5% |
| | | |

| | | |
|---|---|---|
| | | |
| **කොට්ඨාශ අංක 09 ( වාකිරිගල දියුණු කල ප්‍රදේශය )** | | |
| රඹුක්කන පාර වම | 5-385 | 5% |
| රඹුක්කන පාර දකුණ | 6-438/ A | 5% |
| | | |
| **කොට්ඨාශ අංක 10 ( පදවිගම්පල දියුණු කල ප්‍රදේශය )** | | |
| රඹුක්කන පාර වම | 1-21 | 5% |
| රඹුක්කන පාර දකුණ | 2-24 | 5% |
| කුරුණෑගල පාර වම | 7-21 | 5% |
| කුරුණෑගල පාර දකුණ | 2-26 | 5% |
| පොතුහැර පාර වම | 1-55/2/1 | 5% |
| පොතුහැර පාර දකුණ | 2-58 | 5% |
| කහඹිලියාගොඩ පාර වම | 5-5/1 | 5% |
| | | |
| **කොට්ඨාශ අංක 11 ( ගම්දොලහ පත්තුව )** | | |
| පොල්ගහවෙල පාර වම | 195-255/ A | 5% |
| පොල්ගහවෙල පාර දකුණ | 144/3-224 | 5% |

**උප ලේඛනය 03**

| **කාර්තුව** | **ගෙවිය යුතු දිනය** | **5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය** |
|---|---|---|
| පළමු කාර්තුව | ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | ජනවාරි 31 |
| දෙවන කාර්තුව | අප්‍රේල් 01 සිට ජූනි 30 දක්වා | අප්‍රේල් 30 |
| තෙවන කාර්තුව | ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | ජූලි 31 |
| හතරවන කාර්තුව | ඔක්තොම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | ඔක්තොම්බර් 31 |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්_1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය පහත උප ලේඛනයෙහි Iවන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | II වන තීරුව | | |
|---|---|---|---|
| | | | |
| කර්මාන්තය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු.750/-නො ඉක්මවන අවස්ථාව | රු.750/- ඉක්මවන එහෙත් රු.1500/- නො ඉක්මවන අවස්ථාව | රු.1500/- ඉක්මවන අවස්ථාව |
| 1.අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර | 500.00 | 750.00 | 1000.00 |
| 2.ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 3.ආහාර සැපයුම් ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 4.උත්සව ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 5.එළවළු හෝ පළතුරු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 6.ආහාර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 7.මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 8.රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 9.ලැගුම්හල් සහ නවාතැන්පලවල් | 500.00 | 750.00 | 1000.00 |
| 10.සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 11.සිල්ලර වෙළඳසැල් | 500.00 | 750.00 | 1000.00 |
| 12.හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 13.ග්‍රැමෆෝන්, ශබ්ද වාහිනී යන්ත්‍ර යනාදිය ක්‍රියා කරවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14.ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ | 500.00 | 750.00 | 1000.00 |
| 15.බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 16.කිරිපට්ටි සහ කිරි වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 17.අයිස් කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 18.සිසිල් බීම කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 19.ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 20.ගව ගාල් | 500.00 | 750.00 | 1000.00 |
| 21.ඝාතක මඩු | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| | | | |
| 22.පොදු වෙළඳපොලවල් | 500.00 | 750.00 | 1000.00 |
| 23.කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පු | 500.00 | 750.00 | 1000.00 |
| 24.ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය | 500.00 | 750.00 | 1000.00 |
| 25.වාහන සහ සතුන් | 500.00 | 750.00 | 1000.00 |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව කර්මාන්ත බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර රඹුක්කන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වා ගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | II වන තීරුව | | |
|---|---|---|---|
| | | | |
| කර්මාන්තය | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
| | රු.750/-නො ඉක්මවන අවස්ථාව | රු.750/- ඉක්මවන එහෙත් රු.1500/- නො ඉක්මවන අවස්ථාව | රු.1500/- ඉක්මවන අවස්ථාව |
| 1.ඉදල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 2. ලී කැටයම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 3. කුෂන් වැඩ කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 5. පොල් ලී වලින් නිෂ්පාදන කටයුතු | 500.00 | 750.00 | 1000.00 |
| 6. අභ්‍යාස පොත් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 7. ආභරණ රන් ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන උප වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ රඹුක්කන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් එම පනතේ 152 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වා ගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2026 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| **2026 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම** | **රු. ශත** |
| රු.6000 නො ඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු.6000 ඉක්මවන එහෙත් රු.12000 නො ඉක්මවන අවස්ථාවක | රු.90.00 |
| රු.12000 ඉක්මවන නමුත් රු.18750 නො ඉක්මවන විට | රු.180.00 |
| රු.18750 ඉක්මවන නමුත් රු.75000 නො ඉක්මවන විට | රු.360.00 |
| රු.75000 ඉක්මවන නමුත් රු.150000 නො ඉක්මවන විට | රු.1200.00 |
| රු.150000 ඉක්මවන විට | රු.3000.00 |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව අක්කර බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටියාවූද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) ඉහත කී පනතේ 134 වගන්තිය 3 වැනි උප වගන්තියේ අතුරු ව්‍යවස්ථාව යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් 1989.03.10 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත 2026 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීම : සහ

(ආ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2026 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කලයුතු යැයි ද යෝජනා කරන්නීය.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2026 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව වාහන සහ සත්ව බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සහ හතරවන උප ලේඛනයේ විධිවිධාන වලින් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර රඹුක්කන ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| | රු. ශත |
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ම | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා<br>(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්<br>(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | <br><br>18.00<br>4.00 |
| | |
| පෝරම ගාස්තු | 16.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථාන පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි උප වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමටත් හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක,

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය (1.2) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2026 ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%) වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම සඳහා 2% බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර රඹුක්කන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව විනෝද බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ වන I උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව රඹුක්කන ප්රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සංදර්ශනයක්, ප්‍රදර්ශනයක්, සෑම චිත්‍රපට දර්ශනයක්, ආදර්ශ චිත්‍රපට දර්ශනයක්, සර්කස් සංදර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 10% ක විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව ඉඩම් විකිණීම මත බදු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් රඹුක්කන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු පැනවීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

වර්ෂ 2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 2264/18 දරණ වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ඇ කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකරකම් සම්බන්ධයෙන් මෙහි උප ලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු බවට යෝජනා කරන්නීය.

තවද එකී කර්මාන්තය සඳහා බලපත්‍ර ගාස්තු නිකුත් කිරීමට පෙර එම කර්මාන්තය සඳහා යොදාගෙන ඇති මූලික ආයෝජන ප්‍රමාණය පදනම් කරගෙන පහත පළමු උප ලේඛනයේ සඳහන් අයුරින් පරීක්ෂා කිරීමේ ගාස්තු හා ඊට අදාළ බදු මුදල් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උප ලේඛනය 1**

පරීක්ෂණ ගාස්තුව (වර්ෂ තුනටම අදාළව)

| මූලික ආයෝජන මුදල | අයකරන ගාස්තුව<br>රු. ශත |
|---|---|
| රු.250,000.00 හෝ ඊට අඩු | 3000.00 |
| රු.250,001.00 හෝ රු.500,000.00 දක්වා | 3750.00 |
| රු.500,001.00 හෝ රු.1,000,000.00 දක්වා | 5000.00 |
| රු.1,000,000.00 හෝ ඊට වැඩි | 10,000.00 |

පරිසර බලපත්‍ර ගාස්තුව රු.4500.00ක් හා ඊට අදාළ බදු මුදල 10%ක් සමඟ බලපත්‍ර ගාස්තුව රු.4950.00ක් වසර 3ක් හෝ ඊට අඩු කාලයක් සඳහා අයකිරීම.

**උප ලේඛනය 2**

පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාකාරකම්

01. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදිත කර්මාන්ත

02. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත

03. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්රි)

04. රෙදි වියන යන්ත්‍ර/මැෂින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත

05. දිනකට ලීටර් 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

06. පොල්තෙල් හා ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

07. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත

08. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මොල්

09. මාසික නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් 1000 කට අඩු වන ඇඹරුම්හල්

10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වේලීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත

11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.

12. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත

13. සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව වාණිජමය තේ මිශ්‍ර කිරීමේ /මුහුවම් කිරීමේ කර්මාන්ත

14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත

15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

16. ඕනෑම අවස්ථාවක වැඩුනු පක්ෂීන් 100ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂී ගොවිපලවල්

17. ඕනෑම අවස්ථාවක වැඩුනු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්

18. ඕනෑම අවස්ථාවක වැඩුනු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්

19. ඕනෑම වැඩුනු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්

20. ගබඩා ධාරිතාවය ඝණ මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන

21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත

22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

23. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු

24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමු ද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්

25. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත

26. උළු සහ ගඩොල් කර්මාන්ත

27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත

29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු

30. දිනකට ඝණ මීටර් 25 ට අඩු ඉතුරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත

31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත

32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත

33. සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයින් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්

35. විසිරි පින්තාරු කිරීම හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ

36. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත

37. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා

39. මෙම උප ලේඛනයේ ඇ කොටසේ ඇතුලත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම්, දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ සහ 2025 නොවැම්බර් මස 11 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.III යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (I) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ විධිවිධාන පිළිගැනීමටත්, එපරිදි රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට, ඇලකට හෝ ඉහළින් පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම් වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026 වර්ෂයේ සිට අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| **විස්තරය** | **වර්ග අඩි 01 කට**<br>**රු. ශත** |
|---|---|
| බැනරයක් මඟින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය | 40.00 |
| කටවුට් | 50.00 |
| ස්ථිර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම | 150.00 |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය, ක්‍රීඩාපිටි වෙන් කිරීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු ශ්‍රවණාගාරය, ක්‍රීඩාපිටි වෙන්කිරීම මෙහි පහත දැක්වෙන උපලේඛන අංක 1 සහ 2 හි සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2026 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමට රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය 1**

| රඹුක්කන ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය | අයකිරීම | ගාස්තුව<br>රු. ශත | ආරක්ෂිත ඇප<br>රු. ශත |
|---|---|---|---|
| 01. රඹුක්කන ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය කුලියට දීම. | දිනකට | 4000.00 | 2000.00 |
| 02. රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවය සඳහා | දිනකට | 3000.00 | |
| ශබ්දවාහිනී පද්ධතිය සඳහා | දිනකට | 5000.00 | |

**උප ලේඛනය 2**

| රඹුක්කන ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාපිටි සහ භූමිය එක් දිනක් සඳහා වෙන්කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම | දිනකට | ආරක්ෂිත ඇප |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| රඹුක්කන අශෝක මහජන ක්‍රීඩාංගනය සඳහා | 3500.00 | 1000.00 |
| බතඹුරය මහීපාල හේරත් මහජන ක්‍රීඩාංගනය සඳහා | 3500.00 | 1000.00 |
| පාසැල් ළමුන් සඳහා | 2000.00 | |
| සැණකෙළියක් සහ සංගීත ප්‍රසංගයක් සඳහා | 7000.00 | 20000.00 |
| හෙලිකොප්ටරයක් නවතා තැබීම | 5000.00 | |
| මල් පැළ වෙළදාම සඳහා | 2000.00 | 1000.00 |
| වෙනත් | 1000.00 | |

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**
**2026 වර්ෂයට අදාලව වෙනත් කුලී/සේවා ගාස්තු අය කිරීම.**

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තොම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.VII යටතේ සහ 2025 නොවැම්බර් මස 11 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඊ.01.III යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේදී.

**යෝජනාව**

රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු පහත උප ලේඛනයේ පළමු කොටසේ සඳහන් යන්ත්‍ර සූත්‍ර කුලී පදනම මත ලබාදීමේ දී සහ එම උප ලේඛනයේ දෙවන කොටසේ සඳහන් භාණ්ඩ, පෝරම හා සේවා ලබාදීමේ දී එම උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් යන්ත්‍රය, සේවාව, භාණ්ඩය සඳහා එම උප ලේඛනයේ II වන තීරුවේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් 2026 වර්ෂය වෙනුවෙන් පනවා අයකිරීම රඹුක්කන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| <u>**පළමු කොටස**</u> | |
| 1. බැකෝ ලෝඩරය සඳහා අවම පැය දෙකක ගාස්තුව( සහා අරමුදල්) | රු. 8000.00 |
| වැඩිවන පැයක ගාස්තුව | රු. 2000.00 |
| අවම පැය දෙකක ගාස්තුව (පෞද්ගලික) | රු.10000.00 |
| වැඩිවන පැයක ගාස්තුව | රු. 4500.00 |
| 2. බොබ්කැට් යන්ත්‍රය සඳහා පැය තුනක ගාස්තුව | රු.18000.00 |
| වැඩිවන පැයක ගාස්තුව | රු. 6000.00 |
| 3. කුඩා ලෙලන තලනය සඳහා දිනකට ගාස්තුව | රු. 5000.00 |
| 4. කුඩා මාර්ග තලනය සඳහා දිනකට ගාස්තුව | රු. 7000.00 |
| 5. තණකොළ කපන යන්ත්‍රය සඳහා පැයක ගාස්තුව | රු. 2000.00 |
| 6. **ගලි බවුසරය සේවයේ යෙදවීම සඳහා** | |
| බවුසර් එකක් ඉවතට ගැනීම සඳහා ගාස්තුව ( බල ප්‍රදේශය තුළ) | |
| ගෘහස්ථ | රු. 7500.00 |
| ව්‍යාපාරික | රු. 9000.00 |
| ගලි බවුසරය සඳහා ගාස්තුව ( බල ප්‍රදේශයෙන් පිට) | |
| ගෘහස්ථ | රු.11000.00 |
| ව්‍යාපාරික | රු.14000.00 |
| බැහැරලීමට වලක් සභාව විසින් සපයා ගැනීමේ ගාස්තුව | රු. 1000.00 |
| ධාවන ගාස්තුව කිලෝ මීටර් එකක් සඳහා | රු. 100.00 |
| 7. ජල බවුසරය සඳහා ගාස්තුව ( බල ප්‍රදේශය තුළ) | රු. 5500.00 |
| ( බල ප්‍රදේශයෙන් පිට) | රු.10000.00 |
| ධාවන ගාස්තුව කිලෝ මීටර් එකක් සඳහා | රු. 100.00 |
| 8. මෝටර් ග්‍රේඩරය පැය හයකට අඩු ඕනෑම කාලයක් සඳහා | රු.45000.00 |
| මීටර් පැය හය ඉක්මවන කාලයක් සඳහා පැයක ගාස්තුව | රු. 7500.00 |
| 9. කියුබ් 2 1/2 ටිපර් රථය සඳහා දිනකට ගාස්තුව | රු.15000.00 |

<u>දෙවන කොටස</u>

1. රෙදි හට් එකක් සඳහා දිනකට ගාස්තුව රු. 500.00

2. තාවකාලික ගෝඝාතක ගාස්තුව රු. 750.00

3. කොම්පොස්ට් පොහොර කිලෝග්‍රෑම් 1 ක් සඳහා රු. 20.00

කිලෝග්‍රෑම් 5 ක් සඳහා රු. 100.00

කිලෝග්‍රෑම් 10 ක් සඳහා රු. 200.00

කිලෝග්‍රෑම් 25 ක් සඳහා රු. 500.00

ටොන් 1 කට වැඩිනම් කිලෝග්‍රෑම් 1 ක් සඳහා රු. 15.00

4. ලේඛන සෙවීමේ ගාස්තුව (එක් වර්ෂයක් සඳහා) රු. 100.00

5. **දේපළ සංශෝධන ගාස්තුව**

පෝරම ගාස්තුව රු. 200.00

පෙරසැරි ගාස්තුව රු. 300.00

6. පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තුව රු. 250.00

පරිසර බලපත්‍ර අලුත්කිරීමේ අයදුම්පත් ගාස්තුව රු. 50.00

7. **අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා පෝරම ගාස්තුව**

කොස්,රටදෙල්,ගැහැණු තල් ගස් සහ පොල් ගස් සඳහා පෝරම ගාස්තුව රු.500.00

අනෙකුත් ගස් සඳහා පෝරම ගාස්තුව රු. 200.00

8. මිනින්දෝරු සැලසුම් අයදුම්පත් ගාස්තුව රු. 250.00

ගොඩනැගිලි සැලසුම් අයදුම්පත් ගාස්තුව රු.1000.00

9. කර්මාන්ත බිල්පත් ගාස්තුව රු. 100.00

10.වීථි රේඛාවක් නිකුත් කිරීමේ ගාස්තුව රු.1000.00

11.**ජල නළ එලීම සඳහා මාර්ගය පළුදු කිරීම සඳහා ගාස්තුව**

- තාර පාරක් හෝ කොන්ක්‍රීට් පාරක් හරහා කැඩීමට අය කරන ආපසු නොගෙවන මුදල රු.1500.00
- තාර පාරක් හෝ කොන්ක්‍රීට් පාරක් හරහා කැඩීමට අය කරන ආපසු ගෙවන ඇප තැම්පත් මුදල රු.5000.00
- බොරලු පාරක් හරහා කැඩීමට අය කරන ආපසු නොගෙවන මුදල රු. 500.00
- අඩි පාරක් හරහා කැඩීමට අය කරන ආපසු නොගෙවන මුදල රු. 200.00
- මාර්ග උරහිස වලක් කැපීමේ ගාස්තුව රු. 500.00
- මාර්ග උරහිස දිගේ පලුදු කිරීමට අඩි 01 ක ගාස්තුව රු. 50.00
- මාර්ග ගැසට් පිටපතක් සඳහා ගාස්තුව රු.250.00
- තාර හෝ කොන්ක්‍රීට් පාරක දිගේ පලුදු කිරීමට අඩි 01 ක් සඳහා ගාස්තුව රු.200.00

**( කැඩෙන දුර ප්‍රමාණය අනුව පළාත් සභා මිල ගණන් යටතේ තැම්පත් මුදල තීරණය කරනු ලැබේ.)**

මෙම ගාස්තු වලට අමතරව රජය විසින් පනවන ලද බදු අයකරනු ලැබේ.

**12. මෘතදේහ ආදාහනය, මිහිදන් කිරීම හා තැම්පත් කිරීම සඳහා ගාස්තු අයකිරීම.**

1. බල ප්‍රදේශය තුළ එක් ආදාහනයක් කිරීම සඳහා ගාස්තුව රු.12500.00
2. බල ප්‍රදේශයෙන් පිටත එක් ආදාහනයක් කිරීම සඳහා ගාස්තුව රු.18000.00
3. විජයමන්නාහේන සුසාන භූමියේ මිහිදන් ගාස්තුව රු. 500.00